

# බැබිලෝනියාවේ වළං බිඳීම

## කස්තිරම

ඩී බී කුරුප්පු

අම්බලමක්ම නොවේ. මහ බලවතුන්ගේ තානායම් පළක් - කෙළි මඬලක් - බවට පත් වූ පරණ බැබිලෝනියාව තුළ සම්ප්‍රාප්ත වූ බලවතුන් විසින් ම කරනු ලබන වෘෂභ චරිත නිරූපනයකි.

ටයිග්‍රීස් - යුප්‍රටීස් ගංගාධාරයේ පිහිටි භූමිය ලෝක ශිෂ්ටාචාරයේ උල්පත වශයෙන් සළකනු ලැබේ. ශිෂ්ටාචාරයේ තොටිල්ල යන සුරතල් නාමය ඒ පෙදෙස හැඳින්වීමට භාවිත වනුයේ එං හේතුවෙනි.

ඒ දේශය තමාගේ ආධිපත්‍යය යටතට ගෙන පාලනය කළ සදාම් හුසේන් ඇමරිකාවේ නායක ජෝර්ජ් බුෂ් ඇතුළු පිරිසට නිසි පරිදි හසුරුවාලීම අපහසු විය. තමාගේ නෑදෑයන් තරමට සමීප හිතවතුන් විසින් පාලනය කරුනු ලබන සවුදි අරාබියේ පැවති ස්ථාපිත පාලනය සැදැහි සිතින් වැළඳගන්නා අතර හුසේන්ගේ ඒකාධිපති පාලනය නොරිස්සීමට හේතුව ඒ පාලකයා තමන්ට අකීකරු වීමය. ජාත්‍යන්තර වශයෙන් අකීකරු දරුවකු ලෙසට හංවඩු ගැසීමට එකම සුදුසුකම එක්සත් ජනපදය සමග පැටලෙන්නට යාමය. ලෝක ශිෂ් ටාචාරයේ මුල් බිම පාලනය කළත් සදාම් හුසේන් ඒ පාඩම ඉගෙනගෙන තිබුණේ නැත.

ලෝක ශිෂ්ටාචාරයේ මුල් බිමේ රැකවරණ සහිත වූ බැග්ඩෑඩ් කෞතුකාගාරයේ තැන්පත් කර තිබුණ මිල කළ නොහැකි කෞතුක භාණ්ඩ අතුරුදන් වූයේ ඇමරිකන් සෙබළුන්ගේ අනුදැනුම කෙසේ වුවත් නොසැලකිල්ල කිසා ය. එසේ සිදු වන හානිය ගැන ලොව දැනුවත් කිරීමට ඉදිරිපත් වූයේද බ්‍රිතාන්‍ය විද්වතුන්ය. ඒ ගැන කතා කිරීමට පවා ආක්‍රමණිකයෝ කල්පනා නොකළහ.

අඬන්නට බලාගෙන හිටපු ඇමරිකන් බබාගේ ඇහැට ඇඟිල්ලෙන් ඇන්නේ ඇමරිකානු නිර්මා-ණයක් වූ ඔසාමා බින් ලාඩන් ය. 9/11 ඝාතනය නිසා කම්පාවට පත් තම රටේත් මුළු ලොවත් ජනතාව ඉදිරියේ වීරයකු ලෙසින් පෙනී සිටි ජෝර්ජ් බුෂ් බින් ලාඩන්ට උඩගෙඩි දුන් දුෂ්ටයා අනාවරණය කරගත්තේය. ඒ අනෙකකු නොව තමන්ගේ සතුරාට අනුග්‍රහය දැක් වූ - ත්‍රස්තවාදීන්ට රැකවරණය දෙමින් ලොව වැනසීමට අවිආයුධ ගොඩ ගසාගෙන සිටි සදාම් හුසේන් ය. ඔහු මෙල්ල කිරීම තමන්ටත් ලෝකයටත් සාමය උදා කිරීමේ එකම මග බව සොයා ගත් ඔහු මේ කතන්දරය එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය ඉදිරියේ කියා පෑමට පෙරට යැව්වේ තමාගේ යුද පෙරමුණට එරෙහිව සිටි රාජ්‍ය ලේකම් කොලින් පවල් ය. ඒ මතභේද අමතක කළ හමුදාපතිවරයා කියන බොරුව රස කර කර කීවේ ය. බොරුවට සරදම් කළ හැකි යයි සිතූ ලෝක ප්‍රකට චිත්‍ර ශිල්පී පිකාසෝගේ ගුවර්නිකා චිත්‍රය වසන් කිරීමටද ඔහු සමත් විය.

රචනා කර කියපු මුසාවෙන්වත් තමන්ට රිසි තීරණය ලබා ගැනීමට සමත් නොවූ ජේර්ජ් බුෂ් ලොව මුහුණපා සිටි උවදුර මැඩලීමේ සද් ක්‍රියාවට බි(තාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර් සහ ඕස්ට්‍රේලියානු අගමැති ජෝන් හොවාර්ඩ් බඳු නායකයන් ද හවුල් කර ගැනීමට සමත් විය.

වළං බිඳීමේ ව්‍යාපාරය පටන් ගත්තේ මේ ප්‍රථම වෘෂභ ආක්‍රමණය සමග ම ය. ලෝක ශිෂ්ටාචාරයේ මුල් බිමේ රැකවරණ සහිත වූ බැග්ඩෑඩ් කෞතුකාගාරයේ තැන්පත් කර තිබුණ මිල කළ නොහැකි කෞතුක භාණ්ඩ අතුරුදන් වූයේ ඇමරිකන් සෙබළුන්ගේ අනුදැනුම කෙසේ වුවත් නොසැලකිල්ල කිසා ය. එසේ සිදු වන හානිය ගැන ලොව දැනුවත් කිරීමට ඉදිරිපත් වූයේද බ්‍රිතාන්‍ය විද්වතුන්ය. ඒ ගැන කතා කිරීමට පවා ආක්‍රමණි කයෝ කල්පනා නොකළහ.

බැග්ඩෑඩ් කෞතුකාගාරයේ ආරක්ෂා සහිතව තිබිය යුතු - කලින් එසේ තිබුණු - ඓතිහාසික භාණ්ඩ අද ඉස්රායලය ඇතුළු රටවල් ගණනාවක් ඇති බව පෙන්වා දෙන ලද්දේ ද එබඳු වියතුව් විසින් ය.

මහ බලවතා විසින් කළ යුතුව තිබුණේ වළං බිඳීම නවත්වා එසේ පැහැරගෙන ගොස් තිබූ භාණ්ඩ නැවත ඒ කෞතුකාගාරයට ලබා දීම ය - ඒවා ආරක්ෂා කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදවීමය.

ඒ කිසිවක් කළ බවක් දක්නට නැත

ඒ වෙනුවට ඔහුගේ අනුප්‍රාප්තික බරක් ඔබාමා දැන් කරන්නේ වළං බිඳින්නන්ට තවත් දොරක් විවෘත කර දීමය . ඇමරිකානු හමුදා සහ හිතමිතුරු රටවල හමුදා විසින් ඇති කරන ලද නව වාතාවරණය විසින් නිර්මාණය කරන ලද නව ත්‍රස්තවාදීන් වන මුස්ලිම් අන්තවාදීන් දැන් පරණ සෙල්ලම එනම් වළං බිඳීම බිය සැක නැතිව කරගෙන යන බව වාර්තා වෙයි. ඔවුන් අත ගසා ඇත්තේ මෙතෙක් සුරක්ෂිතව පැවති ඓතිහාසික නගරයකටය. එහි කෞතුක වස්තුවලටය. ඒ කිසිවක් ඉරාකයට හෝ ලෝකයාට ඉතිරි නොවනු ඇත. ඉතිරිවන්නේ පරණ ඡායාරූප පමණකි.

මේ විනාශය ගැන විග්‍රහ කරන කිසිම විද්‍යාඥයකු ඉස්ලාම් අන්තවාදීන්ට දොස් කියනවා මිස ඔවුන් ඉරාකය තුළ පණ ගසා පෙරමුණට ඒම සඳහා උචිත වාතාවරණය සකස් කිරීමේ වගකීම දැරිය යුතු බලවතුන් ගැන වචනයක් කතා කරන පාටක් නැත.

සදාම් හුසේන් ඇමරිකාවේ මිණුම් දණ්ඩට පමණක් නොව කාගේ වුවත් සම්තයට පටහැනිව ක්‍රියා කළ රාජ්‍ය නායකයෙක් විය. ලෝකය එබඳු නායකයන් විරහිත පිරිසිදු ජය බිමක් නොවේ. මුස්ලිම් අන්තවාදීන්ට ඉඩ නොදී නවීන සමාජයක වාසය කිරීමේ අවස්ථාව සිය රට වැසියාට සළසා දීමට ඔහු සමත් විය. එබඳු පාලකයකු ඉවත් කොට රට වැසියා මුදා ගැනීමේ කාර්ය භාරය අන් රටක පාලකයන්ට සිය කැමැත්තෙන්ම පවරා ගැනීමට ඉඩක් තිබිය නොහැකිය.

එබඳු හේතු යුක්තියක් අනුව ක්‍රියා කිරීමට මහ බලවතුන් - විශේෂයෙන් එක්සත් ජනපදය - අසමත් වීම නිසා ලෝක සාමය තහවුරු වනු වෙනුවට තව තවත් ගැටලු උද්ගත වන බව අමුතුවෙන් කිව යුතු



නොවේ.

බුෂ් විසින් සිය ආක්‍රමණය සමග රටට හඳුන්වා දෙන ලද ප්‍රජාතන්ත්‍රවාදයට රට තුළ පවත්නා සැඟවුණ විෂමතා සහ ගෝත්‍රිකවූත් ආගමික වූත් පරස්පරතා නිරාකරණය කිරීමේ ශක්තියක් නොවීය.

නොබෝදා සිදු වූ මහා වළං බිඳීමට උචිත වාතාවරණය ඇති කළ ආක්‍රමණිකයන් එහි ලා පූර්ණ වගකීම බාර ගත යුතුය.

## සන්නස Cartoon by PK




VCE Chemistry 2014

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited
Priyantha Liyanage
0407664546